රජතුමා එය දැන මොහු ගනුවයි ඇමතියන්ට අණ කළේ ය.

❖ උත්තියො ඤතවා භීතො පලායිතවා අඤඤතථ වසනෙතා එකසමිං දිවසෙ දෙවිං සරිතවා පණණං ලිඛිතවා එකං දහරං භිකඛුවෙසං ගාහාපෙතවා ඉදං රහසෙසන දෙවියා දෙහීති පණණං අදාසි.

උත්තිය දැන බියෙන් පලාගොස් එකතැනක වාසය කරන්නේ එක් දිනක දේවිය සිහිකොට ලියුමක් ලියා එක් තරුණයෙක් භික්ෂුවෙස් ගන්වා මෙය රහසින් දේවියට දෙන්න යැයි ලියුම දුන්නේ ය.

❖ තදා කල්‍යාණියතෙථරො නිචචං රාජගෙහෙ පරිභුඤජති.

එකල කල්‍යාණ තෙර නිචර රාජගෘහයෙහි (දන්) වළඳයි.

WWW.PIRIVENA.LK

❖ දූතො ගන්ත්වා රාජද්වාරෙ ඨිතො ථෙරො තං රාජකුලූපගො අයන්ති සඤ්ඤමකාසි.

දූතයා ගොස් රාජ දොරටුවෙහි සිටියේ තෙරුන් වහන්සේ මොහු රජගෙට එන අයෙකියි සිතුවේ ය.

❖ රාජපුරිසා'පි ථෙරස්ස අන්තෙවාසිකො අයන්ති චින්තෙසුං.

රාජපුරුෂයෝ ද මොහු තෙරුන්ගේ අතවැසියෙකියි සිතූහ.

❖ අථ රාජා ච රාජමහෙසිකා ච තෙ සක්කච්චං පරිවිසිත්වා වන්දිත්වා පක්කමිංසු.

ඉක්බිති රජතුමා ද රාජ දේවිය ද ඔවුන් සකසා දන් පිළිගන්වා වැඳ ගියහ.

❖ තතො දූතො තං ලෙඛං දෙවියා පෙක්ඛමානාය භූමියං පාතෙසි.

ඉක්බිති දූතයා ඒ ලියුම දේවිය බලා සිටිද්දී බිමට දැමී ය.

❖ රාජා තස්ස සද්දං සුත්වා නිවත්තෙත්වා ඔලොකෙත්වා ථෙරස්ස ලෙඛන සමාන ලෙඛං දිස්වා නිස්සංසයං ථෙරෙන කතකම්මන්ති මඤ්ඤමානො කුජ්ඣිත්වා එතං තෙලකටාහෙ ඛිපථා'ති ආණාපෙසි.

රජතුමා ඒ ශබ්දය අසා නැවතී බලා තෙරුන්ගේ අකුරු සමාන ලිපිය දැක නිසැකවම තෙරුන් විසින් කරන ලද ක්‍රියාවකැයි සිතන්නේ කෝපයට පත්වී මොහු තෙල් සැලියට දමව් යැයි අණකළේ ය.

2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිලිතුරු සපයන්න.

❖ කල්‍යාණියතිස්සො නාම රාජා කුහිං ඉස්සරං පවත්තෙසි ?

කල්‍යාණියතිස්සො නාම රාජා සීහලදීපෙ ඉස්සරං පවත්තෙසි.

❖ තදා කො උපරාජා අහොසි ?

තදා උත්තියො උපරාජා අහොසි.

WWW.PIRIVENA.LK

- ❖ උත්තියො කාය විස්සාසං අකාසි ?
  උත්තියො අග්ගමහෙසියා සද්ධිං විස්සාසං අකාසි.
- ❖ උත්තියො කථං දෙවියා පණ්ණං පෙසෙසි ?
  උත්තියො දූතෙන පෙසෙත්වා දෙවියා පණ්ණං පෙසෙසි.
- ❖ දූතො කෙන සද්ධිං රාජගෙහං පාවිසි ?
  දූතො කල්‍යාණියත්ථෙරෙන සද්ධිං රාජගෙහං පාවිසි.

අභ්‍යාසය

01. පහත දැක්වෙන වාක්‍ය සිංහලට නගන්න.

i. දාරකො එකං ගොණං පස්සති.
දරුවා එක් ගොනෙකු බලයි. (දකියි)

ii. දාරිකා පීඨෙ නිසීදති.
දැරිය පුටුවෙහි හිඳියි.

iii. වාණිජො මනුස්සෙ පස්සති.
වෙළෙන්දා මිනිසුන් දකියි.

iv. රුක්ඛම්හා ඵලං පතති.
ගසින් ගෙඩිය වැටෙයි.

v. නාරී වනම්හා දාරූනි ආහරති.
ගැහැනිය වනයෙන් දර ගෙනෙයි.

vi. අයං සීහො එකං ඉත්ථිං මාරෙති.
මේ සිංහයා එක් ස්ත්‍රියක මරයි.

vii. ත්වං වත්ථානි වික්කිණිත්වා මූලං ලභසි.
නුඹ වස්ත්‍ර විකුණා මුදල් ලබහි.

viii. අහං පුප්ඵානි ඔචිනාමි.
මම මල් නෙළමි.

ix. සො තිණං ආහරති.
ඔහු තණකොළ ගෙනෙයි.

WWW.PIRIVENA.LK

x. ත්වං විහාරං ගච්ඡසි.

නුඹ විහාරයට යහි.

02. ඉහත වාක්‍යවල උක්තය හා ආඛ්‍යාතය බහුවචනයට හරවා නැවත ලියන්න.

i. දාරකා එකං ගොණං පස්සන්ති.
ii. දාරිකායො පීඨෙ නිසීදන්ති.
iii. වාණිජා මනුස්සෙ පස්සන්ති.
iv. රුක්ඛම්හා ඵලනි පතන්ති.
v. නාරියො වනම්හා දාරූනි ආහරන්ති.
vi. ඉමෙ සීහා එකං ඉත්ථිං මාරෙන්ති.
vii. තුම්හෙ වත්ථානි වික්කිණිත්වා මූලං ලභථ.
viii. මයං පුප්ඵානි ඔචිනාම.
ix. තෙ තිණං ආහරන්ති.
x. තුම්හෙ විහාරං ගච්ඡථ.

03. පහත සඳහන් වාක්‍ය සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.

i. ව්‍යාධො එකං ගොණං මාරෙති.
ii. බාලකො පීඨෙ නිසීදති.
iii. වානරො මනුස්සෙ පස්සති.
iv. රුක්ඛම්හා ඵලානි පතන්ති.
v. වනිතායො වනම්හා දාරූනි ආහරන්ති.
vi. දුග්ගතො වත්ථානි වික්කිණිත්වා මූලං ලභති.
vii. දාරකො පුප්ඵානි ඔචිනාති.
viii. රාජා නරං තාළෙති.
ix. උපාසකො විහාරං ගච්ඡති.

WWW.PIRIVENA.LK

04. පහත සඳහන් ගාථා සිංහලට නගන්න.

1. න හි සො උපක්කමො අත්ථි - යෙන ජාතා න මීයරෙ
ජරම්පි පත්වා මරණං - එවං ධම්මො හි පාණිනො

උපන් යමෙකු නොමැරී ජීවත් වීමට උපක්‍රමයක් නැත. ජරාවටත් පැමිණ සත්වයන් මෙසේ මරණ ධර්මය වන්නේ ම ය.

2. දහරා ච මහන්තා ච - යෙ බාලා යෙ ච පණ්ඩිතා
සබ්බෙ මච්චුවසං යන්ති - සබ්බෙ මච්චුපරායනා

බාලයෝ ද මහත් වූවෝ ද යම් අනුවණයෝ ද යම් පණ්ඩිතයෝ ද සියල්ලෝ ම මරු වසඟයට යති. මරණය පිහිට කොට ඇත.

05. පහත සඳහන් වාක්‍ය සිංහල වාක්‍ය රටාව අනුව පරිවර්තනය කරන්න.

i. ඉදං රහස්සෙන දෙවියා දෙහි.
මෙය රහසින් දේවියට දෙන්න.

ii. තදා කල්‍යාණියත්ථෙරො නිච්චං රාජගෙහෙ පරිභුඤ්ජති.
එකල්හි ක ල්‍යාණතෙර නිතර රාජගෘහයෙහි දන් වළඳයි.

iii. ථෙරො තං රාජකුලූපගො අයන්ති සඤ්ඤමකාසි.
තෙරහු මේ රජතුමාගේ සමීපතමයෙකියි සිතූ හ.

iv. තෙ සක්කච්චං ථෙරං පරිවිසිත්වා වන්දිත්වා පක්කමිංසු.
ඔවුහු මනාසේ තෙරුන්ට වළඳවා වැඳ ගියහ.

v. රාජා එතං තෙලකටාහෙ ඛිපථාති ආණාපෙසි.
රජු මොහු තෙල්කටාරමේ හෙළව්' යැයි අණ කළේ ය.

WWW.PIRIVENA.LK

එකොළොස්වැනි පාඩම

අභ්‍යාසය

1. 'කිං පටිගච්චෙ'ව වායමිතෙන' ඡේදය සිංහලට නගන්න.

❖ කිං පටිගච්චෙ'ව වායමිතෙන

කල් ඇතිවම උත්සාහ කිරීමෙන් කිම.

❖ රාජා ආහ.

රජතුමා කීවේ ය.

❖ භන්තෙ නාගසෙන' කිං පටිගච්චෙ'ව වායමිතෙන ? නනු සම්පත්තෙ කාලෙ වායමිතබ්බන්ති ? ථෙරො ආහ.

ස්වාමීනි නාගසේන, කල් ඇතිවම උත්සාහ කිරීමෙන් කිම? පැමිණි කල්හි උත්සාහ කළ යුතු නොවේ ද? තෙරහු කීහ.

❖ සම්පත්තෙ කාලෙ මහාරාජ, වායාමො අකිච්චකරො භවති.

මහරජ, කාලය පැමිණි කල්හි උත්සාහය නිෂ්ඵල වෙයි.

❖ පටිගච්චෙ'ව වායාමො කිච්චකරො භවතී'ති.

කල් ඇතිවම උත්සාහය ඵල සහිත වෙයි.

❖ ඔපම්මං කරොහී'ති.

උපමාවක් කරන්න.

❖ තං කිං මඤ්ඤසි මහාරාජ, යදා ත්වං පිපාසිතො භවෙය්‍යාසි, තදා ත්වං උදපානං ඛණාපෙය්‍යාසි, තළාකං ඛණාපෙය්‍යාසි, පානීයං පිවිස්සාමී'ති ?

මහරජතුමනි, නුඹ කුමක් සිතහිද? යම් කලෙක නුඹ පිපාසිත වන්නේ නම් එදා නුඹ ළිඳක් හාරවන්නේ නම් විලක් හාරවන්නේ නම් පැන් බොන්නෙමි'යි ?

❖ න හි භන්තෙ'ති

නැත ස්වාමීනි

WWW.PIRIVENA.LK

❖ එවමෙව ඛො මහාරාජ සමපත්තෙ කාලෙ වායාමෙ අකිච්චකරො භවති. පටිගච්ච'ච වායාමො කිච්චකාරො භවතී'ති.

එසේම මහරජතුමනි කාලය පැමිණි කල්හි උත්සාහය නිෂ්ඵල වෙයි. කල් ඇතිවම උත්සාහය ඵල සහිත වෙයි.

❖ භීය්‍යො ඔපම්මං කරොහී'ති.

තවත් උපමාවක් කරන්න.

❖ තං කිම්මඤ්ඤසි මහාරාජ, යදා ත්වං බුභුක්ඛිතො භවෙය්‍යාසි. තදා ත්වං ඛෙත්තං කසාපෙය්‍යාසි. සාලිං රොපාපෙය්‍යාසි, ධඤ්ඤං අතිහරාපෙය්‍යාසි භත්තං භුඤ්ජිස්සාමී'ති ?

නුඹ කුමක් සිතහිද මහරජතුමනි. යම් කලෙක කනු කැමැත්තෙහි. එකල නුඹ කුඹුර සාවන්නේ නම් ගොයම් රෝපණය කරවන්නේ නම් ධනය ගෙන්වන්නේ නම් බත් කන්නෙමියි?

❖ න හි භන්තෙ'ති.

නැත ස්වාමීනි.

❖ එවමෙව ඛො මහාරාජ සමපත්තෙ කාලෙ වායාමො අකිච්චකරො භවති. පටිගච්ච'ච වායාමො කිච්චකරො භවතී'ති

එසේම මහරජතුමනි කාලය පැමිණි කල්හි උත්සාහය නිෂ්ඵල වෙයි. කල් ඇතිවම උත්සාහය ඵල සහිත වෙයි.

❖ භීය්‍යො ඔපම්මං කරොහී'ති.

තවත්උපමාවක් කරන්න.

❖ තං කිම්මඤ්ඤසි මහාරාජ, යදා යදා තෙ සඞ්ගාමො පච්චුපට්ඨිතො භවෙය්‍ය, තදා ත්වං පරිඛං ඛණාපෙය්‍යාසි, ගොපුරං කාරාපෙය්‍යාසි, අට්ටාලකං කාරාපෙය්‍යාසි, ධඤ්ඤං අතිහරාපෙය්‍යාසි, තදා ත්වං හත්ථිස්මිං සික්ඛෙය්‍යාසි, අස්සස්මිං සික්ඛෙය්‍යාසි, රථස්මිං සික්ඛෙය්‍යාසි, ධනුස්මිං සික්ඛෙය්‍යාසි, ථරුස්මිං සික්ඛෙය්‍යාසී'ති ?

නුඹ කුමක් සිතහිද මහරජතුමනි. යම් කලෙක ඔබට යුද්ධයක් එළඹියේ වන්නේ නම් එදා නුඹ දිය අගල

WWW.PIRIVENA.LK

හාරවන්නෙහි දොර කොටුවක් කරවන්නෙහි, අට්ටාලයක් කරවන්නෙහි ධනය නෙ එන්නෙහි එදා නුඹ ඇත් ශිල්පයෙහි හික්මවන්නෙහි නම් අස් ශිල්පයෙහි හික්මවන්නෙහි නම් රථ ශිල්පයෙහි හික්මවන්නෙහි නම් ධනු ශිල්පයෙහි හික්මවන්නෙහි නම් කඩු ශිල්පයෙහි හික්මවන්නෙහි නම් කුමක් හඟියි ද?

❖ න හි භන්තෙ'ති.

නැත ස්වාමීනි.

❖ එවමෙව ඛො මහාරාජ, සම්පත්තෙ කාලෙ වායාමො අකිච්චකාරො භවති. පටිගච්චෙ'ව වායාමො කිච්චකාරො භවතී'ති.

එසේම මහරජතුමනි, කාලය පැමිණි කල්හි උත්සාහය නිෂ්ඵල වෙයි. කල් ඇතිවම උත්සාහය ඵල සහිත වෙයි.

2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො නාගසෙනත්ථෙරං පඤ්හං පුච්ඡි ?

මිළින්දො මහාරාජා නාගසෙනත්ථෙරං පඤ්හං පුච්ඡි.

ii. උදකත්ථාය මනුස්සා කිං කරිස්සන්ති ?

උදකත්ථාය මනුස්සා උදපානං තළාකං කරිස්සන්ති.

iii. රාජානො කිමත්ථාය පරිඛං ඛණාපෙන්ති ?

රාජානො රාජධානිං ආරක්ඛාය පරිඛං ඛණාපෙන්ති.

iv. තුම්හෙ කුතො උදකං ලභථ ?

නළෙන මයං උදකං ලභාම.

v. රාජා නගරං රක්ඛිතුං කිං කිං කරොති ?

රාජා නගරං රක්ඛිතුං පරිඛං ඛණති, ගොපුරං කාරාපෙති, අට්ටාලකං ච ධඤ්ඤං හරාපෙති. හත්ථිස්මිං අස්සස්මිං, රථස්මිං, ධනුස්මිං, ථරුස්මිං සික්ඛාපෙති.

WWW.PIRIVENA.LK

අභ්‍යාස

01. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. බොහෝ රජවරු සැප ඇත්තෝ වෙති.
බහු රාජානො සුඛිතත්තා භවන්ති.

ii. රට වැසියෝ ද දැහැමි වෙති.
රට්ඨවාසිනො ච ධම්මිකා භවන්ති.

iii. මම දෙවනුව ද බුදුන් සරණ යමි.
අහං දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.

iv. පෙර බෝසත් බරණැස උපන්නේ ය.

v. පුබ්බෙ බොධිසත්තො බාරාණසියං උප්පජ්ජි.

vi. යමෙක් පමා වූවෝ වෙත් ද? ඔවුහු මළාහු වැනි ය.

vii. යො පමාදො තෙ මච්චුනො සදිසො

02. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. සො සම්බාධාය ඝරාවාසො ඉති විදිත්වා පබ්බජි.
ඔහු ගිහිගෙය කරදර සහිතයි යැයි දැන පැවිදි විය.

ii. සචෙ චතුත්ථං නිධාපෙය්‍ය ආපදාසු ඵාසුං භවිස්සති.
ඉදින් සිව්වැනි කොටස තැන්පත් කරන්නේ නම් ආපදා පැමිණි කල පහසු වන්නේ ය.

iii. පඤ්ඤාවන්තස්ස එකාහං ජීවිතං සෙය්‍යො.
පඤ්ඤාවන්තයාගේ එක දවසක් ජීවත් වීම උතුම් වේ.

iv. දෙව ඉමෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා.
මහණෙනි, මේ අන්ත දෙක පැවිද්දා විසින් සේවනය නොකළ යුතුය.

v. අහං පටිසඞ්ඛායොනිසො චීවරං පටිසෙවාමි.
මම නුවණින් පරීක්ෂා කොට සිවුරු ඇසුරු කරමි.

WWW.PIRIVENA.LK

03. 'මා' නිපාතය යොදා පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. වැඩිහිටියන්ට පරිභව නොකරන්න.
වුද්ධානං මා පරිභව.

ii. කිසිවිටෙකත් බොරු නොකියන්න.
කදාචි මා අලිකං භණ.

iii. පවිටු මිතුරන් ඇසුරු නොකරන්න.
මා භජෙ පාපකෙ මිත්තෙ

iv. තිරිසනුන්ට හිංසා නොකරන්න.
තිරච්ඡානං මා හිංසසි.

v. අන් සතු දෑ පැහැර නොගන්න.
පරසන්තකානි මා චොරයසි/ චොරෙසි.

04. සිංහලට නගන්න.

i. කිං ඉදං ?
මේ කුමක්ද?

ii. කො එසො ?
මේ කවුද?

iii. තං කථං හොති ?
එය කෙසේ වෙයි ද?

iv. කස්මා හෙතුනා ආගතොසි ?
කුමක් නිසා ආවෙහි ද?

v. ත්වං කුහිං ගච්ඡසි ?
නුඹ කොහි යහි ද?

vi. කො තුම්හාකං සහායො ?
නුඹගේ සහායකයා කවුද ?

vii. කති වස්සොසි ?
වස් කීයක් වෙහි ද?

WWW.PIRIVENA.LK

viii. කෙ එතෙ ?

ඒ කවරහු ද?

ix. කිං නිස්සාය ගච්ඡසි ?

කුමක් නිසා යහි ද?

x. කුහිං තව භාතා ?

නුඹේ සහෝදරයා කොහි ද?

xi. කථං සුඛදුක්ඛං ?

කොහොමද සැපසනීප ?

xii. කත්ථ තව ගෙහං ?

නුඹේ ගෙදර කොහි ද?

xiii. කස්මා ආගතොසි ?

කුමකට පැමිණියෙහි ද ?

xiv. කුහිං තස්ස පොත්ථකං ?

නුඹගේ පොත කොහි ද?

xv. ඉමෙසු කතරො පුරිසො තුය්හං භාතා ?

මේ අය අතරින් නුඹගේ සහෝදර පුරුෂයා කවු ද?

xvi. කො තත්ථ සල්ලපති ?

එහි කවරෙක් කතා කරයි ද?

xvii. කුතො ආගතොසි ?

කොහි සිට ආවෙහි ද ?

xviii. කිං ඉච්ඡසි ?

කුමක් සිතහි ද?

xix. කස්ස එසා ලෙඛනී ?

මේ පෑන කාගේ ද?

xx. කෙන ඉදං කතං ?

මෙය කවුරු විසින් කරන ලද්දේ ද?

WWW.PIRIVENA.LK

දොළොස්වැනි පාඩම

අභ්‍යාසය

1. 'සිප්පෙසු කොවිදො හොහි' ඡේදය සිංහලට නගන්න.

❖ සිප්පෙසු කොවිදො හොහි

ශිල්පයෙහි දක්ෂයෙක් වන්න.

❖ එකදිවසං එකා වනිතා අත්තනො පුත්තෙන සද්ධිං විහාරං ගච්ඡති.

එක් දිනක් එක් වනිතාවක් තමාගේ පුතා සමග විහාරයට යයි.

❖ අථ තස්ස පුත්තො එකං යාචකං දිස්වා මාතරං පුච්ඡති.

ඉක්බිති ඇගේ පුතා එක් යාචකයෙකු දැක මව විචාරයි.

❖ කො'යං අම්මා'ති ?

අම්මේ මේ කවුද?

❖ මාතා වදති.

අම්මා කියයි.

❖ යාචකො'යං තාතා'ති.

දරුව මේ යාචකයෙකි' යනුවෙනි.

❖ යාචකො අම්ම, කිං නාම කරොතී'ති ?

අම්මේ යාචකයා කුමක් නම් කරයිද?

❖ සො කිර පුත්ත, භික්ඛං යාචති. භික්ඛාය එව ජීවිකං කප්පෙතී'ති.

පුතේ ඔහු සිඟමන් ඉල්ලයි. සිඟමනෙන්ම ජීවිකාව කරයි.

❖ අම්ම, භික්ඛාචාරං කිර දුක්කරං.

මෑණියනි, සිඟමන වනාහි දුෂ්කර ය.

❖ අථ කස්මා සො භික්ඛාය ජීවිකං කප්පෙතී'ති ?

කුමක් නිසා ඔහු සිඟමනෙන් ජීවිකාව කරයි ද?

❖ එසො කිර පුත්ත අලසො. අනාරද්ධවිරියො.

පුතේ මොහු අලසයෙකි. වීර්ය නැත්තෙකි.

WWW.PIRIVENA.LK

❖ සො දහරකාලෙ කිඤ්චි සිප්පං උග්ගණ්හිතුං න වායමි.

ඔහු ළමාකාලයේ කිසි ශිල්පයක් උගැනීමට වෑයම් නොකළේ ය.

❖ මාතාපිතුසු ආචරියස්ස සන්තිකං පෙසෙන්තෙසු'පි න කිඤ්චි උග්ගණ්හි.

මව්පියන් ගුරුවරයා සමීපයට යැව්වත් කිසිවත් නො උගත්තේ ය.

❖ තස්මා සො කිඤ්චි ජීවනොපායං න ජානාති. සිප්පං අජානන්තෙන භික්ඛාය විනා කත්තබ්බං නත්ථී'ති.

ඒ නිසා ඔහු කිසි ජීවන උපායක් නොදනියි. ශිල්ප නොදැනීම නිසා සිඟමනෙන් හැර කළයුත්තක් නැත'යනුවෙනි.

❖ නාහං අම්ම, භික්ඛාය ජීවිතුං ඉච්ඡාමි. අහං පන සාධුකං උග්ගණ්හිස්සාමී'ති.

අම්මේ මම සිඟමනෙන් ජීවත් වීමට නො කැමැත්තෙමි. මම හොඳින් ඉගෙන ගන්නෙමි'යි යනුවෙනි.

❖ සාධු තාත, සාධුකං උග්ගණ්හිත්වා සබ්බසිප්පෙසු කොවිදො හොහි.

හොඳයි පුතේ. මනාසේ ඉගෙන ගෙන සියලු ශිල්පයන්හි දක්ෂයෙක් වන්න.

❖ අථ සුඛං ජීවාහී'ති.

ඉක්බිති සුවසේ ජීවත් වන්න' යනුවෙනි.

❖ විජ්ජා දදාති විනයං

ඉගෙනීම හික්මීම දෙයි.

❖ විනයෙන භවති ඡෙකතා

හික්මීමෙන් දක්ෂ බව වෙයි.

❖ ඡෙකතා දෙති සම්පත්තිං

දක්ෂ බවෙන් සම්පත් දෙයි.

❖ තෙන ධම්මං තතො සුඛං

එයින් ධර්මයට ද සැපයට ද පැමිණෙයි.

WWW.PIRIVENA.LK

2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කෙ විහාරං ගච්ඡන්ති ?
   වනිතා පුත්තෙන සද්ධිං විහාරං ගච්ඡන්ති.

ii. කො යාචකං පස්සි ?
   පුත්තො යාචකං පස්සි.

iii. යාචකො කථං ජීවති ?
   යාචකො භික්ඛාය ජීවති.

iv. මාතා පිතරො යාචකං දහරකාලෙ කත්ථ පෙසෙසුං ?
   මාතාපිතරො යාචකං දහරකාලෙ ආචරියස්ස සන්තිකං පෙසෙසුං.

v. සබ්බසිප්පෙසු කොවිදො කථං ජීවති ?
   සබ්බසිප්පෙසු කොවිදො සුඛං ජීවති.

අභ්‍යාසය

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ලෝප, ආදේශ හා ආගම යන සන්ධි විධි සඳහා උදාහරණය බැගින් සපයන්න.
   - ලෝපය - ලොකග්ගො
   - ආදේශය - චන්දොදයො
   - ආගම - තිවඞ්ගිකං

ii. පූර්ව වර්ණය හා පර වර්ණය යනු මොනවා ද?
   සන්ධි වන තැන පෙර පදයේ අග අකුර පූර්ව වර්ණය ලෙසත් පර පදයේ මුල් අකුර පර වර්ණය ලෙසත් සැලකේ.

iii. සන්ධි විධි අට නම් කරන්න.
   ලෝපය, ආදේශය, ආගමය, ද්විත්වය, දීර්ඝය, හ්‍රස්වය, ආරෝහණය, විපර්යාසය

WWW.PIRIVENA.LK

iv. පහත දැක්වෙන පදවල පූර්ව වර්ණය හා පර වර්ණය වෙන් කර දක්වන්න.

විසන්ධිය	පූර්ව වර්ණය	පර වර්ණය
සිගාලො + අපි	ඔ	අ
නගරෙ + එව	එ	එ
අව + ලොකෙත්වා	අ	ල්
පති + ආගමි	ඉ	ආ
එවං + ආහ	අං	ආ
සෙට්ඨි + ඨානං	ඉ	ඨ්
දෙවානං + ඉන්දො	අං	ඉ
ජීවන + උපායං	අ	උ
දුක්ඛ + පත්තො	අ	ප්
අහං + එව	අං	එ

2. 'සිප්පෙසු කොවිදො හොහි' ඡේදයෙහි ඇති සන්ධි පද උපුටා විසන්ධි කර දක්වන්න.

- යාචකො + අයං
- භික්ඛා + චාරං
- න + ආරද්ධවිරියො
- පෙසෙනේතසු + අපි
- ජීවන + උපායං
- කො + අයං
- අම්මා + ඉති
- උ + ගණ්හිතුං
- කිං + චි
- කා + තබ්බ
- න + අහං

WWW.PIRIVENA.LK

3. පහත දැක්වෙන පදවල සන්ධි විධි නම් කරන්න.

1	වත	+	ඉදං	වතිදං	ලෝපය
2	අච්ඡරිය	+	පත්තො	අච්ඡරියප්පත්තො	ද්විත්වය
3	අථ	+	අපරභාගෙ	අථාපරභාගෙ	දීර්ඝය
4	සද්දං	+	අකාසි	සද්දමකාසි	ආදේශය
5	ආකාසෙ	+	එව	ආකාසෙව	ලෝපය
6	ධූපෙන	+	එතෙන	ධූපෙනෙතෙන	ලෝපය

4. පහත දැක්වනෙ වාක්‍ය සිංහලට නගන්න.

i. අතීතෙ එකස්මිං වණසණ්ඩෙ සිගාලො විහාසි.

අතීතයේ එක් වණලැහැබක හිවලෙක් වාසය කළේ ය.

ii. පුරා ලඞ්කායං අනුරාධපුරපුලත්ථිපුරාදීනි නගරානි අහවිංසු.

පෙර ලංකාවෙහි අනුරාධපුර පොළොන්නරුව ආදි නගර විය.

iii. පුබ්බෙ විය සම්පති නගරෙසු ගොපුරං වා අට්ටාලකං වා නත්ථි.

පෙර මෙන් දැන් නගරවල ගෝපුර හෝ අට්ටාල හෝ නැත.

iv. අජ්ජ අස්මිං නගරෙ ධූමරථට්ඨානඤ්ච, සන්දෙසාගාරඤ්ච, අධිකරණසාලාදයොපි ච සන්ති.

අද මේ නගරයෙහි දුම්රියපළක් ද තැපැල්හලක් ද උසාවිය ආදිය ද ඇත.

v. තෙන හෙතුනා ගාමිණිකුමාරො දුට්ඨගාමිණී'ති පඤ්ඤායි.

ඒ හේතුවෙන් ගැමුණු කුමාරයා දුටුගැමුණු යැයි ප්‍රසිද්ධ විය.

WWW.PIRIVENA.LK

5. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩ වසන සේක.

එකං සමයං භගවා සාවත්ථියං විහරති.

ii. ඒ දේවතාවා එකත් පසෙක සිටියේ ය.

සා දෙවතා එකමන්තං අට්ඨාසි.

iii. සත්ත්වයෝ ධර්මයෙන් සැප ලබත්.

සත්තා ධම්මෙන සුඛං ලභන්ති.

iv. සූර්ය රශ්මියෙන් පියුම් පිපෙයි.

සූරියරංසියෙන පදුමානි විකසති.

v. ඒ ශිෂ්‍යයෝ ගුරුවරයාගේ අවවාදය පිළිගත්හ.

තෙ සිස්සා ආචරියස්ස ඔවාදං සම්පටිච්ඡිං.

WWW.PIRIVENA.LK

දහතුන් වැනි පාඩම

අභ්‍යාසය

1. 'උපක්කමො' ඡේදය සිංහලට නගන්න.

❖ උපක්කමො

උපක්‍රමය

❖ රාජා තං කාරණං දිස්වා භයප්පත්තො එසො ඛො මං මාරෙත්වා රජ්ජම්හි ගහිතුං සමත්ථො, එතං මාරෙතුං වට්ටතී'ති චින්තෙත්වා නගරං සම්පත්තො කුමාරං පක්කොසාපෙත්වා අමච්චෙ ආහ.

රජතුමා එම කාරණය දැන භීතියට පත් වී මොහු මා මරා රජකමත් ගන්නට සමත් ය. මොහු මරන්නට වටී'යි සිතා නගරයට පැමිණ කුමාරයා කැඳවා ඇමතියන්ට කීවේය.

❖ ඉමං භණෙ බන්ධනාගාරෙ කරොථා'ති ආණාපෙසි.

බොලව්, මොහු බන්ධනාගාරගත කරවු යැයි අණ කළේ ය.

❖ තෙ තථා කරිංසු' අථ'ස්ස වසන්තස්ස චත්තාරො මාසා අතික්කන්තා.

ඔවුහු එසේ කළහ. ඉක්බිති එසේ වසන ඔහුට සිව් මසක් ඉක්ම ගියේ ය.

❖ තතො රාජා චතුමාසච්චයෙන දීඝතො සට්ඨිහත්ථප්පමාණෙ සට්ඨිවෙළුකලාපෙ ආහරාපෙත්වා ගණ්ඨියො සොධාපෙත්වා අන්තො අයොසාරං පූරෙත්වා රාජඞ්ගණෙ ඨපාපෙත්වා විසමලොමකුමාරං බන්ධනාගාරතො ආහරාපෙත්වා අමච්චෙ එවමාහ.

රජතුමා මාස හතරක් ඇවෑමෙන් දිගින් හැට රියන් ප්‍රමාණ උණමිටි හැටක් ගෙන්වා, ගැට ශුද්ධ කොට ඇතුළත යකඩ කුරු පුරවා රජමිදුලෙහි තබ්බවා විසම ලෝම කුමාරයා බන්ධනාගාරයෙන් ගෙන්වා ඇමතියන්ට මෙසේ කීවේ ය.

WWW.PIRIVENA.LK

- ❖ භණෙ සචායං කුමාරො ඉමිනා බගෙන වෙළුකලාපෙ චතුරඞගුලං චතුරඞගුලං කත්‍වා ජිනදතු.

  බොලව්, මේ කුමාරයා කඩුවෙන් උණමිටි අඟල් හතරක් බැගින් කොට කපාවා.

- ❖ නො චෙ ජිනදතුං සකෙකාති, තං මාරෙථා'ති ආහ.

  ඉදින් කපන්නට නොහැකි නම් ඔහු මරව් යැයි කීවේ ය.

2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. එතං මාරෙතුං වටටතී'ති කො චිනෙතසි ?

   එතං මාරෙතුං වටටතී'ති රාජා චිනෙතසි.

ii. කෙ කං බනධනාගාරෙ ඨපෙසුං ?

   රාජා විසමරාජකුමාරං බනධනාගාරෙ ඨපෙසි.

iii. බනධනාගාරෙ වසනතසස තසස කති මාසා අතිකකනතා ?

   බනධනාගාරෙ වසනතසස තසස චතු මාසා අතිකකනතා.

iv. රාජා සටඨිවෙළුකලාපෙ ආහරිත්‍වා කිං කිං අකරි ?

   රාජා සටඨිවෙළුකලාපෙ ආහරිත්‍වා ගණ්ඨියො සොධාපෙත්‍වා අනෙතා අයොසරං පූරයි.

v. අනෙතා වෙළුකලාපෙ කානි පූරෙසි ?

   අනෙතා වෙළුකලාපෙ අයොසරං පූරෙසි.

අභ්‍යාසය

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. ප්‍රධාන සන්ධි ප්‍රභේද නම් කරන්න.

   ස්වර සන්ධිය, ව්‍යඤ්ජන සන්ධිය, නිග්ගහීත සන්ධිය

WWW.PIRIVENA.LK

ii. සන්ධි ප්‍රයෝජන ලියා දක්වන්න.

කෙටි බව, උච්චාරණයේ පහසුව, ලේඛනයේ පහසුව, ව්‍යක්ත බව, ගාථා බන්ධනයේ දී ඡන්දස් සුරැකීමට හැකි බව

iii. ස්වර සන්ධි ප්‍රභේද ලියා දක්වන්න.

- පූර්ව ස්වර ලෝපය
- පර ස්වර ලෝපය
- අසවර්ණාදේශය
- යකාරාදේශය
- වකාරාදේශය
- දකාරාදේශය
- රිකාරාදේශය
- අජ්ඣ අබ්භ ආදේශය
- පූර්ව ස්වර දීර්ඝය
- පර ස්වර දීර්ඝය
- ආගමය (යවමදනතරළග)

iv. ස්වර සන්ධි ප්‍රභේදයන්ට අදාළ බාලාවතාර සූත්‍රපාඨ ලියන්න.

- පූර්ව ස්වර ලෝපය - සරා සරෙ ලොපං
- පර ස්වර ලෝපය - වා පරො අසරූපා
- අසවර්ණාදේශය - කචචාසවණ්ණං ලුතෙත
- යකාරාදේශය - ඉවණ්ණො යනනවා / යමෙදනතසසාදෙසො
- වකාරාදේශය - වමොදුදනතානං
- දකාරාදේශය - දොධසස ච
- රිකාරාදේශය - එවාදිසසරි පුබ්බො ච රසෙසා
- අජ්ඣ අබ්භ ආදේශය - අජෙඣා අධි අබෙභා අභි
- පූර්ව ස්වර දීර්ඝය - පුබ්බො ච
- පර ස්වර දීර්ඝය - දීඝං

WWW.PIRIVENA.LK

- ආගමය (යවමදනතරළාචාගමා)

2. 'උපක්කමො' ඡේදයේ ඇති සන්ධි පද උපුටා දක්වන්න.

- භයප්පත්තො
- රජ්ජම්පි
- වට්ටතී'ති
- සම්පත්තො
- අට්ඨස්ස
- අතික්කන්තා
- චතුමාසච්චයෙන
- හත්ථප්පමාණෙ
- රාජඞ්ගණෙ
- එවමාහ
- චතුරඞ්ගුලං
- සක්කොති
- මාරෙථා'ති

3. පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කරන්න.

i. තෙන + එව - තෙනෙව
ii. පන + එකදා - පනෙකදා
iii. චිරෙන +එව - චිරෙනෙව
iv. ඉති + ආදීනි - ඉච්චාදීනි
v. වස්ස + උදකෙන - වස්සොදකෙන
vi. පාතො + එව - පාතොව
vii. නගරෙ + ඉව - නගරෙව
viii. පති + ආගමි - පච්චාගමි
ix. පන + එසො - පනෙසො
x. ඉදානි + අපි - ඉදානිපි
xi. පාදෙ + අපි - පාදෙපි

WWW.PIRIVENA.LK

xii. අභි + උග්ගතො - අබ්භුග්ගතො

4. පහත සඳහන් සන්ධිපද විසන්ධි කරන්න.

i. තස්මාතිහ - තස්මා + ඉහ
ii. ආකාසෙව - ආකාසෙ + එව
iii. තථූපමං - තථා + උපමං
iv. නාතික්කමති - න + අතික්කමති
v. සාධූති - සාධු + ඉති
vi. මාතාති - මාතා + ඉති
vii. තථාපි - තථා + අපි
viii. සූරියාලොකං - සූරිය + ආලොකං
ix. පුථගෙව - පුථ + එව

5. පහත සඳහන් සන්ධි ප්‍රභේද සඳහා නිදසුන් දෙක බැගින් ලියන්න.

- පූර්ව ස්වර ලෝපය - ලොකග්ගො, චිරෙනෙව
- පර ස්වර ලෝපය - බුද්ධොපි, තථාපි
- අසවර්ණාදේශය - වසෙසාදකෙන, චන්දොදය
- අබ්භාදේශය - අබ්භුග්ගතො, අබ්භුග්ගඤ්ඡි

WWW.PIRIVENA.LK

දාහතරවැනි පාඩම

අභ්‍යාසය

1. 'අච්ඡරියං' පාඨය සිංහලට නගන්න.

❖ අච්ඡරියං

ආශ්චර්යය/ පුදුමය

❖ තං සුත්වා'පි රාජා අසද්දහන්තො මනුස්සෙ ආණාපෙසි.

එය අසාත් රජතුමා විශ්වාස නොකරන්නේ මිනිසුන්ට අණ කළේය.

❖ එතාය හත්ථපාදෙ ගහෙත්වා අග්ගිම්හි පක්ඛිපථා'ති.

ඇයගේ අත් පා ගෙන ගින්නෙහි දමව් යනුවෙනි.

❖ තෙ තථා කරිංසු.

ඔවුහු එසේ කළහ.

❖ අථ සා අග්ගිම්හි පක්ඛිපමානා නත්ථෙත්ථ මෙ කොචි පටිසරණො'ති සරණමෙව සරණං කරොමී'ති චින්තෙත්වා බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සඞ්ඝං සරණං ගච්ඡාමී'ති වදන්ති.

❖ ඉක්බිති ඇය ගින්නෙහි දමන්නී මට කිසි පිළිසරණක් නැත. තුන් සරණයම සරණ කරමියි සිතා බුදුන් සරණ යමි, දහම් සරණ යමි, සඟුන් සරණ යමි'යි කියන්නී,

❖ මනසා ච අනුස්සරන්තී, අග්ගිම්හි පති.

මනසින් ද සිහිකරන්නී ගින්නෙහි වැටිණි.

❖ තතො තථාවිධො'පි සො අග්ගි තස්සා සරීරෙ ලොමකූපමත්තම්හි උණ්හාකාරං කාතුං නාසක්ඛි.

මෙබඳු ගින්න ද ඇගේ ශරීරයෙහි ලෝමයකුත් උණු කරන්නට නොහැකි විය.

❖ පදුමගබ්භං පවිට්ඨා විය සීති භූතසරීරා අහොසි.

පියුම් ගැබකට පිවිසියාක් මෙන් සිසිල් වූ සිරුර ඇත්තී විය.

WWW.PIRIVENA.LK

❖ රාජා තං අච්ඡරියං දිස්වා සංවිග්ගො ලොමහට්ඨජාතො වෙගෙන තං උපසඞ්කමිත්වා උභොපි හත්ථෙහි පග්ගය්හ උරෙ නිපජ්ජාපෙත්වා රාජාසනෙ නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගය්හ ඨිතො කස්මා තෙ තං අග්ගි සරීරං මා පරිදහී'ති පුච්ඡි.

රජතුමා ඒ ආශ්චර්යය දැක කළකිරුණේ ලොමු ඩැහැගත්තේ වේගයෙන් ඇය කරා පැමිණ දෙ අතින් ඔසවා ගෙන පපුවෙහි හොවාගෙන සිංහාසනයෙහි හිඳුවා ඇඟිලි බැඳගෙන සිටියේ කුමක් නිසා එම ගින්න තිගේ ශරීරය නොදැවී දැයි විමසුවේ ය.

2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො මනුස්සෙ ආණාපෙසි ?

රාජා මනුස්සෙ ආණාපෙසි.

ii. තෙ මනුස්සා කිං කරිංසු ?

තෙ මනුස්සා එතාය හත්ථපාදෙ ගහෙත්වා අග්ගිම්හි පක්ඛිපිංසු.

iii. සා කිං අනුස්සරි ?

සා රතනත්තයං අනුස්සරි.

iv. රාජා කිං දිස්වා ලොමහට්ඨජාතො අහොසි ?

රාජා තං අච්ඡරියං දිස්වා ලොමහට්ඨජාතො අහොසි.

v. තං දිස්වා රාජා කිං අකරි ?

තං දිස්වා රාජා වෙගෙන තං උපසඞ්කමිත්වා උභොපි හත්ථෙහි පග්ගය්හ උරෙ නිපජ්ජාපෙත්වා රාජාසනෙ නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගය්හ තිට්ඨසි.

WWW.PIRIVENA.LK

අභ්‍යාසය

i. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. ව්‍යඤ්ජන සන්ධිය හඳුන්වා උදාහරණ දෙකක් ලියන්න.

සන්ධි වන තැන මුල්පදයේ අග අකුර හෙවත් පෙර අකුර ස්වර අකුරක් වී පසු පදයේ මුල් අකුර හෙවත් පසු අකුර ව්‍යඤ්ජනාක්ෂරයක් වන්නේ නම් එමගින් සිදුවන සන්ධිය ව්‍යඤ්ජන සන්ධිය නම් වේ.

iii. ව්‍යඤ්ජන සන්ධියේ ප්‍රභේද නම් කරන්න.

- පූර්ව ස්වර ලෝපය හා ස්වර ආගමය
- ව්‍යඤ්ජන ද්විත්වය
- අල්පප්‍රාණාක්ෂර ආදේශය
- ඔකාරාදේශය
- අව ආදේශය

iv. ව්‍යඤ්ජන ද්විත්වයට හා අල්පප්‍රාණාක්ෂරාදේශයට නිදසුන් පහ බැගින් සොයා ලියන්න.

<u>ව්‍යඤ්ජන ද්විත්වය</u>

- සප්පුරිසො
- මහබ්බලො
- නිග්ගහ
- සොකප්පත්තො
- අප්පමාදො

<u>අල්පප්‍රාණාක්ෂරාදේශය</u>

- අබ්භුග්ගතො
- අක්ඛාතං
- උග්ඝොසො
- පග්ඝරති
- නික්ඛමම
- මහප්ඵලං

WWW.PIRIVENA.LK

v. නිග්ගහීත සන්ධියේ ප්‍රභේද ලියා දක්වන්න.

- වර්ගාන්තාදේශය
- ඤකාරාදේශය
- ලකාරාදේශය
- මකාරාදේශය
- දකාරාදේශය
- නිග්ගහීත ලෝපය
- නිග්ගහීත ආගමය
- ස්වර ලෝපය

vi. වර්ගාන්තාදේශයට නිදසුන් සොයා ලියන්න.

තඤ්ඤනං, සඤ්ජාතො, කිඞ්කතො, සම්භූතො, සඞ්කප්පො, සඞ්ගහො

vii. ඉහත සඳහන් 'අච්ඡරියං' ඡේදයේ ඇති සන්ධි පද විසන්ධි කර ඒවා කිනම් සන්ධි ප්‍රභේදයකට අයත් දැයි ලියා දක්වන්න.

- සුත්වා'පි - සුත්වා + අපි (පරස්වර ලෝපය)
- පක්ඛිපථා'ති - පක්ඛිපථ + ඉති (පූර්ව ස්වර දීර්ඝය)
- නත්ථෙත්ථ - නත්ථි + එත්ථ (පූර්ව ස්වර ලෝපය)
- පටිසරණො'ති - පටිසරණො + ඉති (පරස්වර ලෝපය)
- අනුස්සරන්ති - අනු + සරන්ති (ද්විත්වය)
- ලොමකූපමත්තම්පි - ලොමකූපමත්තං + අපි (මකාරාදේශය)
- නාසක්ඛි - න + සක්ඛි (පරස්වර දීර්ඝය)
- අච්ඡරියං - අ + ඡරියං (අල්පප්‍රාණාක්ෂරාදේශය)
- උපසඞ්කමිත්වා - උපසං + කමිත්වා - (වර්ගාන්තාදේශය)
- පග්ගය්හ - ප + ගය්හ (ව්‍යඤ්ජන ද්විත්වය)

WWW.PIRIVENA.LK

පසළොස්වැනි පාඩම

අභ්‍යාසය

1. 'ගන්‍ථධුරං විපස්සනාධුරං' යන ඡේදය සිංහලට නගන්න.

❖ ගන්‍ථධුරං විපස්සනාධුරං

ග්‍රන්ථ ධූරය හා විදර්ශනා ධූරය

❖ අතීතෙ සාවත්‍ථියං සහායකා ද්වෙ කුලපුත්තා විහාරං ගන්‍ත්වා සත්‍ථුධම්මදෙසනං සුත්වා පබ්බජිංසු.

අතීතයෙහි සැවැත්නුවර යහළු කුල පුත්‍රයෝ දෙදෙනෙක් විහාරයට ගොස් බුදුරදුන්ගේ දේශනාව අසා පැවිදි වූහ.

❖ තෙ පඤ්චවස්සානි ආචරියුපජ්ඣායානං සන්තිකෙ වසිත්වා සත්‍ථාරං උපසඞ්කමිත්වා 'සාසනෙකති ධුරානී'ති පුච්ඡිංසු.

ඔවුහු පස්වසක් ආචාර්යයන් වහන්සේගේ සමීපයෙහි වාසය කොට බුදුරදුන් වෙත පැමිණ ශාසනයෙහි ධූර කෙතෙක්දැයි විමසූහ.

❖ සත්‍ථා සාසනෙ ගන්‍ථධුරං විපස්සනා ධුරන්ති ද්වෙ ධුරානී'ති ආහ.

බුදුරජාණන් වහන්සේ ශාසනයෙහි ග්‍රන්ථධූරය විදර්ශනා ධූරය යැයි දූර දෙකක් ඇතැයි වදාළ සේක.

❖ තෙසු එකො අහං විපස්සනාධුරං පූරෙස්සාමී'ති විපස්සනං කථාපෙත්වා වායමන්තො සහපටිසම්භිදාහි අරහත්තං පාපුණි.

ඔවුන් අතර එක් තැනැත්තෙක් විදර්ශනා ධූරය පුරන්නෙමියි විදර්ශනාව කීමට සලස්වා වෑයක් කරන්නේ සිව් පිළිසිඹියා පත් සහිතව අර්හත් භාවයට පැමිණියේ ය.

❖ ඉතරො අහං ගන්‍ථධුරං පූරෙස්සාමී'ති තෙපිටකං බුද්ධවචනං උග්ගණ්හිත්වා තෙ ගතගතට්ඨානෙ ධම්මං දෙසෙති.

❖ අනෙකා මම ග්‍රන්ථධූරය පුරන්නෙමි'යි ත්‍රිපිටක බුද්ධවචනය උගෙන ඔහු ගිය ගිය තැන ධර්මය දේශනා කරයි.

WWW.PIRIVENA.LK

- සරභඤ්ඤං භණති.

  හඬනගා කීම ගනියි.

- පඤ්චන්නං භික්ඛුසතානං ධම්මං වාචෙති.

  පන්සියයක් භික්ෂූන්ට ධර්යට උගන්වයි.

- භික්ඛූ සත්ථුසන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා ඉතරං ථෙරං උපසඞ්කමිත්වා තස්සොවාදෙ ඨත්වා අරහත්තං පත්වා ථෙරං වන්දිත්වා 'සත්ථාරං දට්ඨුකාමම්හි'ති වදන්ති.

  භික්ෂූහු බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ගෙන අනෙත් තෙර වෙත පැමිණ උන්වහන්සේගේ අවවාදයෙහි සිට රහත් වී තෙරුන් වහන්සේ වැඳ බුදුරජාණන් වහන්සේ දකිනු කැමැත්තෙමුයි කියති.

2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සහායකා දෙව කුලපුත්තා කිං සුත්වා පබ්බජිංසු ?

   සහායකා දෙව කුලපුත්තා සත්ථුධම්මදෙසනං සුත්වා පබ්බජිංසු.

ii. ද්වින්නං සහායකානං එකො කථං අරහත්තං පාපුණි ?

   ද්වින්නං සහායකානං එකො විපස්සනාධුරං පූරෙත්වා අරහත්තං පාපුණි.

iii. ද්වින්නං සහායකානං ඉතරො කිං අකාසි ?

   ද්වින්නං සහායකානං ඉතරො ගන්ථධුරං පූරි.

iv. තෙ පඤ්චවස්සානි ආචරියුපජ්ඣායානං සන්තිකෙ වසිත්වා සත්ථාරං උපසඞ්කමිත්වා කිං පුච්ඡිංසු ?

   තෙ පඤ්චවස්සානි ආචරියුපජ්ඣානං සන්තිකෙ වසිත්වා සත්ථාරං උපසඞ්කමිත්වා සාසනෙ කතිධුරානී'ති පුච්ඡිංසු.

v. සත්ථුසාසනෙ කති ධුරානි ?

   සත්ථුසාසනෙ ගන්ථධුරං විපස්සනාධුරන්ති දෙව ධුරානි.

WWW.PIRIVENA.LK

අභ්‍යාසය

1. පහත සඳහන් සමාස නම් කරන්න.

i. පඤ්ඤා එව රතනං - පඤ්ඤාරතනං
ii. බුද්ධො ච සො නාගො ච ඉති - බුද්ධනාගො
iii. ගාමං ගතො - ගාමගතො
iv. අග්ගිතො භයං - අග්ගිභයං
v. විඤ්ඤූහි ගරහිතො - විඤ්ඤූගරහිතො

2. පහත සඳහන් සමාස පදයන්හි විග්‍රහ වාක්‍ය ලියන්න.

i. විකාලභොජනං - විකාලෙ භොජනං
ii. බුද්ධධම්මො - බුද්ධස්ස දෙසිතො ධම්මො
iii. චොරභයං - චොරම්හා භයං
iv. තිලොකං - තයො ලොකා
v. මහාවීරො - මහන්තො ච සො වීරො ච

3. පහත සඳහන් සමාන පදයන්හි ප්‍රභේද දක්වන්න.

i. ධම්මබුද්ධි - කම්මධාරය
ii. චක්ඛුසොතං - ද්වන්ද
iii. චතුසච්චං - දිගු
iv. මහාබලං - කම්මධාරය
v. තිදණ්ඩං - දිගු
vi. නීලුප්පලං - කම්මධාරය
vii. රුක්ඛසාඛා - තප්පුරිස
viii. තිභවං - දිගු
ix. බුද්ධසාවකො - තප්පුරිස
x. සද්ධාධනං - කම්මධාරය

WWW.PIRIVENA.LK

4. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. සො දුග්ගතකුලං පස්සති
ඔහු දුප්පත් කුලය දකියි / බලයි.

ii. පුරිසො තිණ්හඵරසුණා රුක්ඛං ඡින්දති.
පුරුෂයා තියුණු පොරොවෙන් ගස සිඳියි.

iii. උපාසකො සත්ථුධම්මං උග්ගණ්හාති.
උපාසකයා ශාස්තෘධර්මය ඉගෙන ගනී.

iv. මහාථෙරො පිණ්ඩාය ගාමං පාවිසි.
මහතෙර පිඬු පිණිස ගමට පිවිසියේ ය.

v. සො උණ්හොදකං මුඛෙ ආසිඤ්චති.
ඔහු උණුජලය කටේ වක්කරයි.

5. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. ඔහු ත්‍රිපිටක බුද්ධ වචනය ඉගෙන ගනියි.
සො තෙපිටක බුද්ධවචනං උග්ගණ්හාති.

ii. ආනන්ද, අනිත්‍ය සංඥාව කවරේ ද?
කතමාචානන්ද අනිච්චසඤ්ඤා ?

iii. රාජ පුරුෂයෝ සොරුන් ලුහුබඳිති.
රාජපුරිසා චොරෙ අනුබන්ධන්ති.

iv. දුකට පත් මිනිසා ආහාර ඉල්ලයි.
දුග්ගතමනුස්සො ආහාරං යාචති.

v. උපාසකයා පන්සිල් රකියි.
උපාසකො පඤ්චසීලං රක්ඛති.

WWW.PIRIVENA.LK

දහසයවන පාඩම

අභ්‍යාසය

1. 'මිත්තධම්මො' ඡේදය සිංහලට නගන්න.

❖ මිත්තධම්මො

මිත්‍ර ධර්මය

❖ සො වම්මිකා නික්ඛම්ම තං තථා නීයමානං දිස්වා සංවිග්ගො දුක්ඛප්පත්තො සහායස්ස මෙ අජ්ජ අවස්සෙන උපත්ථම්භං භවිතුං වට්ටතී'ති තං සමස්සාසෙත්වා අත්තභාවං විජහිත්වා අඤ්ඤතරවෙසෙන රාජපුරිසෙ උපසඞ්කම්ම ඉමං පුරිසං මුහුත්තං මා මාරෙථා'ති දළ්හං වත්වා සො මුහුත්තෙන රඤ්ඤො අග්ගමහෙසියා වසනට්ඨානං ගන්ත්වා සප්පවණ්ණෙන දෙවිං ඩසිත්වා තාය විසෙන මුච්ඡිතකාලෙ මනුස්සවණ්ණෙන වජ්ඣප්පත්තො විසොසධං ජානාති'ති වත්වා තං ඛණෙයෙව සහායස්ස සන්තිකං ගන්ත්වා රඤ්ඤා තව පක්කොසිතකාලෙ ගන්ත්වා උදකප්පසතෙන දෙවියා සරීරෙ පහරිත්වා නිබ්බිසං කරොහී'ති වත්වා පක්කාමි.

උෟ තුඹසින් නික්ම එසේ ගෙනයනු ලබන ඔහු දැක කළකිරුණේ දුකට පැමිණියේ යහළුවාට මා විසින් අද අනිවාර්යයෙන්ම උපකාර වන්නට වටියි ඔහු සනසා ආත්මභාවය අතහැර එක්තරා වෙසකින් රාජපුරුෂයන් වෙත පැමිණ 'මේ මිනිසා මොහොතක් නොමරව්' යනුවෙන් දැඩි කොට කියා ඔහු මොහොතකින් ඔහු රජුගේ අගමෙහෙසිය වාසය කරන තැනට ගොස් සර්ප වෙසින් දේවියට දෂ්ට කොට ඇය විසෙන් සිහිමූර්ජා වූ කල්හි මනුෂ්‍ය වේශයෙන් වධයට පැමිණි පුරුෂයා විස බෙහෙතක් දනිමි'යි කියා එකෙණෙහිම ඒ සහායකයා වෙත ගොස් 'රජ විසින් නුඹ කැඳවූ කල්හි ගොස් දිය පතකින් දේවියගේ සිරුරට ඉස විෂ නැති කරව'යි කියා ගියේ ය.

WWW.PIRIVENA.LK

2\. 'මිත්තධම්මො' ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො වම්මිකා නික්ඛම්ම තං තථා නීයමානං දිස්වා සංවිග්ගො දුක්ඛප්පත්තො ?

නාගො වම්මිකා නික්ඛම්ම තං තථා නීයමානං දිස්වා සංවිග්ගො දුක්ඛප්පත්තො.

ii. සහායස්ස මෙ අජ්ජ අවස්සයෙන උපත්ථම්භං භවිතුං වට්ටතී'ති කො චින්තෙසි ?

සහායස්ස මෙ අජ්ජ අවස්සයෙන උපත්ථම්භං භවිතුං වට්ටතී'ති නාගො චින්තෙසි.

iii. සො තං සමස්සාසෙත්වා අත්තභාවං විජහිත්වා අඤ්ඤතරවෙසෙන කුහිං උපසඞ්කමි ?

සො තං සමස්සාසෙත්වා අත්තභාවං විජහිත්වා අඤ්ඤතරවෙසෙන රාජගෙහං උපසඞ්කමි.

iv. සො මුහුත්තෙන කුහිං ගන්ත්වා සප්පවණ්ණෙන දෙවිං ඩසි ?

v. සො මුහුත්තෙන අග්ගමහෙසියා වසනට්ඨානං ගන්ත්වා සප්පවණ්ණෙන දෙවිං ඩසි.

vi. උදකප්පසතෙන කස්සා සරීරෙ පහරිත්වා නිබ්බිසං කරොහී'ති වත්වා පක්කාමි ?

උදකප්පසතෙන දෙවියාය සරීරෙ පහරිත්වා නිබ්බිසං කරොහී'ති වත්වා පක්කාමි.

අභ්‍යාස

1\. පහත සඳහන් සමාස පද විග්‍රහ කරන්න.

i. උපරිසිඛරං- සිඛරස්ස උපරි

ii. නිග්ගතජනො - නිග්ගත ජනා යස්මිං සො

iii. ජාතරූපරජතං - ජාතඤ්ච රූපඤ්ච රජතඤ්ච

iv. චක්ඛුසොතං - චක්ඛුං ච සොතං ච

v. අනුරථං - රථස්ස පච්ඡා

WWW.PIRIVENA.LK

2. පහත සඳහන් පද සමාස කරන්න.

i. පාණිං ච පදං ච - පාණිපදං
ii. සමපන්නානි සස්සානි යස්මිං සො - ධනවන්තො
iii. භත්තස්ස පච්ඡා - පච්ඡාභත්තං
iv. දින්නං භොජනං යස්ස සො - භික්ඛු
v. කාසි ච කොසලා ච - කාසිකොසලා

3. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. දසබලො සාවකානං ධම්මං දෙසෙති
බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන්ට ධර්මය දේශනා කරයි.
ii. වනිතායො භින්නසට්ඨානි භූමියං පාතෙන්ති.
කාන්තාවෝ බිඳුණු කළ බිම හෙළති.
iii. මාතාපිතරො දාරකානං ඔවාදං කරොන්ති.
මව්පියෝ දරුවන්ට අවවාද කරති.
iv. කුමාරී උපරිපාසාදං ආරුහති.
කුමරිය ප්‍රාසාදයේ උඩට නගියි.
v. පෙතා තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති.
ප්‍රේතයෝ බිත්තියෙන් පිටත තැන්වල සිටිති.

4. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. ඈ නගරය සමීපයෙහි වාසය කළා ය.
සා නගරස්ස සමීපෙ වසි.
ii. දායකයා භික්ෂුවට පාසිවුරු පූජා කරයි.
දායකො භික්ඛුනො පත්තචීවරානි පූජෙති.

WWW.PIRIVENA.LK

iii. ඒ තාපසයා දිනපතා ගංගාව සමීපයට යයි.
සො තාපසො පතිදිනං ගඞගාය සනතිකං ගචඡති.

iv. ඔහු දිවි ඇති තෙක් බුදුන් සරණ ගියේ ය.
සො යාවජීවං බුදධං සරණං ගචඡි.

v. බ්‍රාහ්මණයා පෙරබත් කාලයෙහි දන් දුන්නේ ය.
බ්‍රාහමණො පුරෙභතෙත දානං දදි.

5. පහත සඳහන් පදවල සමාස නාමය දක්වන්න.

i. හංසබකා - දිගු
ii. මහදධනා - කම්මධාරය
iii. අනුරූපං - අව්‍යයීභාව
iv. සීලධනං - කම්මධාරය
v. යාවජීවං - අව්‍යයීභාව
vi. සිතුණහං - ද්වන්ද
vii. අනෙතානගරං - අව්‍යයීභාව
viii. දෙවමනුසසා - ද්වන්ද
ix. ආගතසමණො - බහුබ්බීහි
x. හතථපදමංසලොහිතං - ද්වන්ද

6. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. සමාස හඳුන්වන්න.

පද දෙකක් හෝ ඊට වැඩි පද ප්‍රමාණයක් තනි පදයක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය සමාස යනුවෙන් හැඳින්වේ. 'සමාසො පද සංඛෙපො' යනු බාලාවතාර පාඨය යි. එයින් කියැවෙන්නේ මෙසේ පද කෙටි කරන බවයි.

ii. සමාස ප්‍රභේද කීය ද?

සමාස ප්‍රභේද 06කි. ඒවා නම්,

- කම්මධාරය සමාසය

WWW.PIRIVENA.LK

- දිගු සමාසය
- ද්වන්ද සමාසය
- බහුබ්බීහි සමාසය
- තප්පුරිස සමාසය
- අව්‍යයීභාව සමාසය

iii. සමාස ප්‍රයෝජන ලියා දක්වන්න.

- එක් පදයක් බවට පත් කිරීම නිසා ලේඛනයේ පහසුව
- භාෂණයේ පහසුව
- කෙටි බව
- සංක්ෂිප්ත බව
- ව්‍යක්ත බව ප්‍රකට වීම
- එක් විභක්තියක යෙදීම
- භාෂාව අලංකාර වීම
- ගාථා බන්ධනයේ දී ඡන්දස් සුරැකීමට හැකිවීම

iv. කම්මධාරය සමාසය හඳුන්වන්න.

විශේෂණ පදයක් හා විශේෂ්‍ය පදයක් එක්ව සකස් වන සමාසය කම්මධාරය සමාසය යි. ද්විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො යනු බාලාවතාර පාඨය යි. මෙහි දී විශේෂණ පදයේ හා විශේෂ්‍ය පදයේ ලිංගය වචනය සමාන විය යුතු ය. ද්විපදේ තුල්‍යාධිකරණේ යනුවෙන් කියැවෙන්නේ ද එය යි.

මහන්තො පුරිසො - මහාපුරිසො

රත්තා ලතා - රත්තලතා

v. දින්නභොජනො, යාවජීවං, පත්තචීවරං යන පදවල සමාසය නම් කරන්න.

- දින්නභොජනො - බහුබ්බීහි
- යාවජීවං - අව්‍යයීභාව
- පත්තචීවරං - ද්වන්ද

WWW.PIRIVENA.LK

7. 'මිත්තධම්මො' ඡේදයේ එන සමාස පද උපුටා දක්වන්න.

- දුක්ඛප්පත්තො
- උපත්ථම්භං
- අග්ගමහෙසියා
- සප්පවණ්ණෙන
- මනුස්සවණ්ණෙන
- අත්තභාවං
- අඤ්ඤතරවෙසෙන
- රාජපුරිසෙ
- වසනට්ඨානං
- මුච්ඡිතකාලෙ
- විසොසධං
- උදකපසතෙන
- නිබ්බිසං

WWW.PIRIVENA.LK

දාහත්වැනි පාඩම

අභ්‍යාසය

1. 'ඉත්ථිසද්දො පුරිසස්ස චිත්තං ආකඩ්ඪති' ඡේදය සිංහලට නගන්න.

❖ ඉත්ථිසද්දො පුරිසස්ස චිත්තං ආකඩ්ඪති

ස්ත්‍රී ශබ්දය පුරුෂයාගේ සිත අදියි/ ගනියි

❖ සාමණේරො අරඤ්ඤෙ දාරූනි උද්ධරන්තියා එකිස්සා ඉත්ථියා ගීතසද්දං සුත්වා යට්ඨිකොටිං විස්සජ්ජෙත්වා 'තිට්ඨථ තාව භන්තෙ, කිච්චං මෙ අත්ථී'ති තස්සා සන්තිකං අගමාසි. සො තත්ථ තාය සද්ධිං සීලවිපත්තිං පාපුණි.

සාමණේරයන් වහන්සේ වනයේ දර කඩන එක් ස්ත්‍රියකගේ ගීත හඬ අසා හැරමිටි කොන අතහැර සිටින්න ස්වාමීනී මට වැඩක් ඇතැයි ඇගේ සමීපයට ගියේ ය. ඔහු එහි දී ඇය සමග සීලවිපත්තියට පැමිණියේ ය.

❖ ථෙරො ඉදානි එකො ගීතසද්දො සූයිත්ථ.

තෙරුන් වහන්සේ දැන් ගී හඬක් ඇසුණේ ය.

❖ සො ච ඛො ඉත්ථියා සද්දො, සාමණෙරො'පි චිරායති.

එය ද වනාහි ස්ත්‍රියකගේ හඬකි. සාමණේරයා ද කල් ගනියි.

❖ සො එකංසෙන සීලවිපත්තිං පත්තො භවිස්සතී'ති චින්තෙසි.

මොහු ඒකාන්තයෙන් සීල විපත්තියට පැමිණියේ වන්නේයැයි සිතුවේ ය.

❖ සාමණෙරො'පි අත්තනො කිච්චං නිට්ඨාපෙත්වා ආගමම 'ගච්ඡාම භන්තෙ'ති ආහ.

සාමණේරයා ද තමාගේ කාර්යය නිමවා පැමිණ ගමු ස්වාමීනි යි කීවේ ය.

❖ 'සාමණෙර, පාපො ජාතොසී'ති ථෙරො පුච්ඡි.

සාමණේරය පවක් උපනිදැයි තෙරුන් විමසුවේය.

❖ සො කිඤ්චි න කථෙසි.

ඔහු කිසිවක් නො කීවේ ය.

WWW.PIRIVENA.LK

❖ අථ 'තාදිසෙන පාපකෙන සද්ධිං මම ගමනං නත්‍ථී'ති ථෙරො ආහ.

ඉක්බිති තා වැනි පව්ටෙකු සමග මගේ ගමනක් නැතැයි තෙරුන් කීවේ ය.

❖ සො ගිහී හුත්‍වා 'එථ, භන්‍තෙ, ගච්ඡාමා'ති ථෙරං ආහ.

ඔහු ගිහි බවට පත්වී එන්න ස්වාමීනි යමුයි තෙරුන්ට කීවේ ය.

❖ ථෙරො 'ආවුසො, ගිහී පාපො'පි පාපො. සමණපාපො'පි පාපො.

තෙරුන් ඇවැත්නි ගිහි පාපියාත් පාපියෙකි. ශ්‍රමණ පාපියාත් පාපියෙකි.

❖ තයා සද්ධිං මම ගමනං නත්‍ථී'ති වත්‍වා තං විස්සජ්ජෙසි.

නුඹ සමග මගේ ගමනක් නැතැයි කියා ඔහු අතහැරියේ ය.

❖ සො කන්‍දන්‍තො වනසණ්ඩං පාවිසි.

ඔහු අඬමින් වන ලැහැබට පිවිසියේය.

❖ අථ ථෙරස්ස සීලතෙජෙන සක්කස්ස පණ්ඩුකම්බලසිලාසනං උණ්හං අහොසි.

ඉක්බිති තෙරුන්ගේ ශීල තේජසින් ශක්‍රයාගේ පණ්ඩුකම්බල ශෛලාසනය උණු විය.

❖ සක්කො ලොකං ඔලොකෙන්‍තො දිබ්බෙන චක්ඛුනා ථෙරං අද්දස.

ශක්‍රයා ලෝකය දෙස බලන්නේ දිවසින් තෙරුන් වහන්සේ දුටුවේ ය.

❖ අථ දෙවින්‍දො මග්ගිකවෙසං ගහෙත්‍වා ථෙරං උපසඞ්කමිත්‍වා ථෙරෙන සද්ධිං පටිසන්‍ථාරං කත්‍වා සාවත්‍ථියං ගන්‍තුං ථෙරං පක්කොසි.

ඉක්බිති ශක්‍රයා මගියෙකුගේ වෙස් ගෙන තෙරුන් වෙත පැමිණ තෙරුන් සමග පිළිසඳර කොට සැවැත් නුවරට යාමට තෙරුන්ට කැඳවී ය.

WWW.PIRIVENA.LK

2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සාමණෙරො කාය සද්ධිං සීලවිපත්තිං පාපුණි ?

සාමණෙරො එකිස්සා ඉත්ථියා සද්ධිං සීලවිපත්තිං පාපුණි.

ii. සාමණෙරො අත්තනො කිච්චං නිට්ඨාපෙත්වා ආගම්ම කිං ආහ ?

සාමණෙරො අත්තනො කිච්චං නිට්ඨාපෙත්වා ආගම්ම ගච්ඡාම භන්තෙ'ති ආහ.

iii. 'තාදිසෙන පාපකෙන සද්ධිං මම ගමනං නත්ථී'ති කො ආහ ?

තාදිසෙන පාපකෙහි සද්ධිං මම ගමනං නත්ථී'ති ථෙරො ආහ.

iv. කස්මා සක්කස්ස පණ්ඩුකම්බලසිලාසනං උණ්හං අහොසි ?

ථෙරස්ස සීල තෙජෙන සක්කස්ස පණ්ඩුකම්බලසිලාසලං උණ්හං අහොසි.

v. දෙවින්දො කස්ස වෙසං ගණ්හි ?

දෙවින්දො මග්ගිකස්ස වෙසං ගණ්හි.

අභ්‍යාසය

1. පහත සඳහන් අර්ථ ප්‍රකට වන තද්ධිත පදය දී ඇති නාමයෙන් සකසන්න.

i. රනින් කළ (සුවණ්ණ) - සුවණ්ණමය
ii. වච්ඡගේ පුතා (වච්ඡ) - වච්චාන /වච්චායන
iii. පයින් යන්නා (පද) - පථික
iv. නැවෙහි යෙදුණු (නාවා) - නාවික
v. මගධයේ උපන් (මගධ) - මාගධික
vi. නුවණැති (මෙධා) - මෙධාවි
vii. ගුණැති (ගුණ) - ගුණවා
viii. මෘදු බව (මුදු) - මුදුතා

WWW.PIRIVENA.LK

ix. නවවෙනි (නව) - නවම

x. මහත්බව (විපුල) - වෙපුල්ල

2. පහත දැක්වෙන තද්ධිත පදයන්හි ප්‍රභේද නම් කරන්න.

i. මාණවො - අපච්චත්‍ථ

ii. කච්චායනො - අපච්චත්‍ථ

iii. පාපිට්ඨො - අතිශයත්‍ථ

iv. ගුණවා - අත්‍ථයත්‍ථ

v. දසධා - අව්‍ය

vi. පාපතමො - අතිශයත්‍ථ

vii. ආභිධම්මිකො - අනෙකත්‍ථ

viii. ජනතා - භාව

ix. එකක්ඛත්තුං - අව්‍ය

x. සතිමා - අත්‍ථයත්‍ථ

3. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. කනිට්ඨො රාජපුත්තො සිප්පං උග්ගණ්හාති.
රජුගේ බාලපුතා ශිල්පය උගනියි.

ii. අයං මාණවො කනකවිමානෙ නිබ්බත්තිස්සති.
මේ මානවකයා රන් විමනක උපදින්නේ ය.

iii. ධම්මිකො රාජා කායිකමානසිකං සුඛං වින්දති.
ධාර්මික රජතුමා කායික මානසික සැප විඳියි.

iv. දයාලු භගවා මහාජනතං සන්දිට්ඨිකං ධම්මං දෙසෙසි.
දයාවෙන් යුතු භාග්‍යවතුන් වහන්සේ මහජනතාවට
මෙලොව දී ප්‍රතිඵලදායක ධර්මය දේශනා කළ සේක.

v. තයො තස්ස පාසාදො හොන්ති. එකො හෙමන්තිකො
එකො ගිම්හිකො එකො වස්සිකො.

ඔහුට මාළිගා තුනක් වෙයි. එකක් හේමන්ත කාලයට ය.
එකක් ගිම්හාන කාලයට ය. එකක් වර්ෂා කාලයට ය.

WWW.PIRIVENA.LK

4. සුදුසු තන්හි තද්ධිත පද භාවිත කරමින් පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. සාමණේරයන් වහන්සේ සැමකල්හි සිල් රකිති.
   සාමණේරො සදා සීලානි රක්ඛති.

ii. දයාව ඇති පුරුෂයා යාචකයන්ට බොහෝ අයුරින් දන් දෙයි.
   දයාලූ පුරිසො යාචකස්ස බහුධා දානානි දදාති.

iii. කාන්තාව රනින් කරන ලද ආභරණ මිල දී ගනියි.
   කඤ්ඤා සුවණ්ණමයං ආභරණං කිණාති.

iv. අද මෙහි ඔහුගේ පණ්ඩිත බව ප්‍රකට විය.
   අජ්ජ ඉධ තස්ස පාණ්ඩිච්චං පාකටො අහොසි.

v. ගැල්කරුවා නගරයේ සැමතැනම ගැල ගෙන යයි.
   සාකටිකො නගරෙ සබ්බත්ථ සකටං නයති.

5. නාම හා ප්‍රත්‍යය ගළපා අර්ථවත් තද්ධිත පද සාදන්න.

i.	කච්ච	තර	කච්චාන
ii.	දිවා	ඉක	දිවාතර
iii.	සඞ්ඝ	වී	සංඝික
iv.	පඤ්ඤා	ධා	පඤ්ඤාවන්තු
v.	මායා	සො	මායාවී
vi.	ති	තා	තිධා
vii.	සබ්බ	ආන	සබ්බසො
viii.	ලහු	වන්තු	ලහුතා
ix.	අන්ත	ණ්‍ය	අන්තිම
x.	අරොග	ඉම	ආරොග්‍ය

6. පහත දැක්වෙන තද්ධිත පදයන්හි අර්ථ ලියන්න.

i. පුරාතනං - පැරණි

WWW.PIRIVENA.LK

ii. අට්ඨමං - අටවැනි
iii. එත්ථ - මෙහි
iv. මෙධාවිනී - නුවණ ඇති
v. කදා - කවදා
vi. භාගිණෙය්‍ය - බෑණනු
vii. පාටවං - දක්ෂ
viii. දාරුමයං - දාරුමය/ දැවයෙන් කළ
ix. බාහුසච්චං - ඇසූ පිරූ
x. පුත්තකො - දරුවන් ඇති/ දරුවන් සහිත

WWW.PIRIVENA.LK

දහඅටවැනි පාඩම

අභ්‍යාසය

1. 'මිච්ඡාදිට්ඨිකො අහිගුණ්ඨිකො' ඡේදය සිංහලට නගන්න.

❖ මිච්ඡාදිට්ඨිකො අහිගුණ්ඨිකො

මිථ්‍යාදෘෂ්ටික අහිකුණ්ඨිකයා

❖ එකො අහිගුණ්ඨිකො ගාමනිගමරාජධානිසු සප්පෙ කීළාපෙත්වා ජීවිකං කප්පෙන්තො එකං ගාමකං පත්වා තත්ථ සප්පෙ කීළාපෙත්වා සන්තුට්ඨෙහි ගාමවාසීහි දින්න විවිධොපායනො ඛාදනීයභොජනීයං ඛාදිත්වා භුඤ්ජිත්වා තත්ථෙව නිවාසං ගහෙත්වා නිසීදි.

එක් අහිකුණ්ඨිකයෙක් ගම්නියම්ගම් රාජධානිවල සර්පයන් ක්‍රීඩා කරවා ජීවිකාව කරන්නේ එක් ගමකට පැමිණ එහි සර්පයන් ක්‍රීඩා කරවා සතුටු වූ ගම්වැසියන් දුන් විවිධ පඬුරු කෑයුතු පානය කළයුතු දෑ කා අනුභව කොට එහිම නතර වී හුන්නේ ය.

❖ තස්මිං කිර ගාමකෙ මනුස්සා යෙභුය්‍යෙන රතනත්තයමාමකා, තස්මා තෙ රත්තිභාගෙ සයන්තා 'නමො බුද්ධායා'ති එවමාදිං වදන්ති.

ඒ ගමෙහි මිනිස්සු වනාහි බොහෝ සෙයින් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධා සිත් ඇත්තෝ වූහ. ඒ නිසා ඔවුහු රෑ නිදන්නෝ නමො බුද්ධාය ආදිය කියති.

❖ සො පන අහිගුණ්ඨිකො මිච්ඡාදිට්ඨිකො. තිණ්ණං රතනානං ගුණං න ජානාති.

ඒ අහිකුණ්ඨිකයා වනාහි මිථ්‍යාදෘෂ්ඨිකයෙකි. තෙරුවන්ගේ ගුණ නොදනියි.

❖ තස්මා තෙසං තං වචනං සුත්වා සයම්පි කෙළිං කුරුමානො පරිහාසවසෙන 'නමො බුද්ධායා'ති වදති.

එහෙයින් ඔවුන්ගේ එම වචනය අසා තමන් ද සෙල්ලම් කරන්නේ උපහාස ලෙසින් නමෝ බුද්ධාය යැයි කියයි.

WWW.PIRIVENA.LK

❖ අථෙකදිවසං සො අත්තනො කීළාපනසමත්ථං එකං සප්පං තත්ථ තත්ථ පරියෙසමානො ආහිණ්ඩති.

එක දවසක් ඔහු තමන්ගේ ක්‍රීඩාව කිරීමට එක් සර්පයෙකු ඒ ඒ තැන සොයමින් ඇවිදියි.

❖ තදා එකො නාගරාජා කස්සපදසබලස්ස ථූපං ගන්ත්වා වන්දිත්වා එකං වම්මිකං පවිසති.

එකල්හි එක් නාගරාජයෙක් කාශ්‍යප බුදුරදුන්ගේ චෛත්‍යයට ගොස් වැඳ එක් තුඹසකට පිවිසෙයි.

❖ තං දිස්වා අහිගුණ්ඨිකො වෙගෙනාගන්ත්වා නාගරාජං ගණ්හිතුං මන්තං පරිජපි.

ඌ දුටු අහිකුණ්ඨිකයා වේගයෙන් පැමිණ නාගරාජයා අල්ලා ගැනීමට මන්ත්‍රයක් ජප කළේ ය.

❖ සො මන්තං සුත්වා කුජ්ඣිත්වා තං මාරෙතුකාමො අනුබන්ධි.

ඒ මන්ත්‍රය අසා කිපී ඔහු මැරීමට (නාගරාජයා) ලුහු බැන්දේ ය.

❖ තං දිස්වා අහිගුණ්ඨිකො වෙගෙන පලායන්තො එකස්මිං පාසාණෙ පක්ඛලිත්වා පතමානො පුබ්බෙ වුත්තපරිහාසවචනපරිචයෙන 'නමො බුද්ධායා'ති වදන්තො පති.

ඌ දැක අහිකුණ්ඨිකයා වේගයෙන් පලායන්නේ එක ගලක පය ගැටී වැටෙන්නේ පෙර කියන ලද උපහාස වචනය පුරුදු පරිදි 'නමෝ බුද්ධාය' යැයි කියමින් වැටුණේ ය.

❖ තස්ස තං වචනං අනුබන්ධන්තස්ස නාගරඤ්ඤො සොතපථෙ අමතං විය පති.

ඔහුගේ එම වචනය ලුහුබඳින නා රජුගේ කනෙහි අමෘතය මෙන් වැටුණි.

WWW.PIRIVENA.LK

2. ඡේදය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. අහිගුණ්ඨිකො කථං ජීවිකං කප්පෙති ?
   අහිගුණ්ඨිකො සප්පෙ කීළිත්වා ජීවිකං කප්පෙති.
ii. අහිගුණ්ඨිකො කත්ථ නිවාසං ගහෙත්වා නිසීදි ?
   අහිගුණ්ඨිකො එකං ගාමං නිවාසං ගහෙත්වා නිසීදි.
iii. කෙ රත්තිභාගෙ සයන්තා 'නමො බුද්ධායා'ති වදන්ති ?
   ගාමකෙ මනුස්සා රත්තිභාගෙ සයන්තා 'නමො බුද්ධායා'ති වදන්ති.
iv. සො පන අහිගුණ්ඨිකො මිච්ඡාදිට්ඨිකො උදාහු සම්මාදිට්ඨිකො ?
   සො පන අහිගුණ්ඨිකො මිච්ඡාදිට්ඨිකො භවි.
v. නාගරාජා කිං සුත්වා කුජ්ඣිත්වා තං මාරෙතුකාමො අනුබන්ධි ?
   නාගරාජා මන්තං සුත්වා කුජ්ඣිත්වා තං මාරෙතුකාමො අනුබන්ධි.

අභ්‍යාසය

1. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. ගාමං ගච්ඡන්තො දාරකො හසති.
   ගමට යන දරුවා සිනාසෙයි.
ii. භික්ඛු ගාමෙ විහරන්තො ධම්මං දෙසෙති.
   භික්ෂුව ගමෙහි වාසය කරන්නේ ධර්මය දේශනා කරයි.
iii. කඤ්ඤා හසමානො භාසන්ති.
   කාන්තාවෝ සිනාසෙමින් කියති.
iv. යාචකා පචන්තං ඉත්ථිං ආහාරං යාචන්ති.
   යාචකයෝ උයන ස්ත්‍රියගෙන් ආහාර ඉල්ලති.
v. පුරිසො ඵලානි ඛාදමානො රුක්ඛෙ නිසීදති.
   පුරුෂයා ගෙඩි කමින් ගසෙහි හිඳියි.

WWW.PIRIVENA.LK

2. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

   i. ඔහු නගරයට යන්නේ හඬයි.
      සො නගරං ගච්ඡන්තො රොදති.
   ii. වෙළෙන්දා බඩු විකුණමින් ගම්වල ඇවිදියි.
      වාණිජො භණ්ඩානි වික්කිණන්තො ගාමෙසු චරති.
   iii. ළමයා සිනා සෙමින් ගෙදර ගියේ ය.
      බාලකො හසන්තො ගෙහං ගච්ඡි.
   iv. මව බත් පිසන්නී හිඳියි.
      මාතා භත්තං පචන්තී නිසීදති.
   v. අපි දුවන මිනිසුන් බලමු.
      මයං ධාවන්තෙ මනුස්සෙ පස්සාම.

3. පහත සඳහන් කිතකපද යොදා වාක්‍ය තනන්න.

   i. නිසීදන්තො - නිසීදන්තො බාලකො පාඨං පඨති.
   ii. ධාවන්තී - ධාවන්තී සුනඛී ගොණං පස්සති.
   iii. සුණන්තො - සො අම්හාකං සල්ලපං සුණන්තො හසති
   iv. සයන්තී - දාරිකා සයන්තී සයති.
   v. ගච්ඡන්තියො - ගච්ඡන්තියො කඤ්ඤායො වාණිජං පස්සන්ති.

4. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

   i. සො ගාමං ගතො.
      ඔහු ගමට ගියේ ය.
   ii. බාලකෙහි කථා සුතා.
      ළමයින් විසින් කතා අසන ලදි.
   iii. ආගතාය නරාය ජලං දෙහි.
      පැමිණි මිනිසාට ජලය දෙන්න.

WWW.PIRIVENA.LK

iv. මයා බුද්ධස්ස චරිතං සුතං.
මා විසින් බුදුරදුන්ගේ චරිතය අසන ලදි.

v. නරෙහි ඵලානි ඛාදිතානි.
මිනිසුන් විසින් ගෙඩි කන ලදි.

5. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. ඔහුගේ ගෙදර පුතෙක් උපන්නේ ය.
තස්ස ගෙහෙ පුත්තං ජාතා.

ii. රාම ගමට ගියේ ය.
රාමො ගාමං ගතො.

iii. මිනිසුන් විසින් ඔහුගේ කථාව අසන ලදි.
මනුස්සෙහි තස්ස කථා සුතං.

iv. දරුව, ලියන ලද පාඩම කියවන්න.
දාරක, ලිඛිතං පාඨං වද.

v. මා විසින් මෙසේ අසන ලදි.
එවං මෙ (මයා) සුතං

6. 'මිච්ඡාදිට්ඨිකො අභිගුණ්ඨිකො' ඡේදයේ දැක්වෙන කිතක පද උපුටා දක්වන්න.

- මිච්ඡාදිට්ඨිකො
- අභිගුණ්ඨික
- කීළාපෙත්වා
- කප්පෙනෙතා
- පත්වා
- කීළාපෙත්වා
- දිනන
- ඛාදනීයභොජනීයං
- ඛාදිත්වා

WWW.PIRIVENA.LK

- භුඤ්ජිත්වා
- ගහෙත්වා
- සයන්තා
- සුත්වා
- කුරුමානො
- පරියෙසමානො
- ගන්ත්වා
- වන්දිත්වා
- කුජ්ඣිත්වා
- පලායන්තා
- පක්ඛලිත්වා
- පතමානො
- වදන්තා

7. පහත සඳහන් කිතක පද වර්ග කර දක්වන්න.

- කත්තබ්බං - කිච්ච
- දායක - ත්‍රෛකාලික
- භූත - අතීත
- පචිත්වා - පූර්ව ක්‍රියා
- පචිතුං - තුමන්ත ක්‍රියා
- දාතුං - තුමන්ත ක්‍රියා
- දත්වා - පූර්ව ක්‍රියා
- නීත - අතීත
- පාලක - ත්‍රෛකාලික
- භවනීය - කිච්ච
- ඨත්වා - පූර්ව ක්‍රියා
- වජ්ජ - කිච්ච
- කාතුං - තුමන්ත ක්‍රියා

WWW.PIRIVENA.LK

- ධාතු - ත්‍රෛකාලික
- හීත - අතීත

8. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කිතක පද සාදා ගන්නේ කෙසේ ද?

ධාතුවකට හෙවත් ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් යොදා ගනිමින් සකස් කරගන්නේ කිතක පදයි.

ii. කිතක ප්‍රභේද ලියා දක්වන්න.

කිච්ච, කිතක

iii. අතීත කිතක හඳුන්වා දෙන්න.

අතීත කාලික කිතක අදහසක් හැඟවේ නම් ඒ අතීත කාලික කිතක නම් වේ. ත, තවනතු, තාවි යනු අතීත කිතක නිර්මාණය සඳහා භාවිත කරන ප්‍රත්‍යය කිහිපය යි.

iv. අව්‍යය කිතක පැහැදිලි කරන්න.

අවසාන ක්‍රියාවට මුලින් යෙදෙන ක්‍රියා මේ නමින් හැඳින් වේ. එනම් පූර්ව ක්‍රියා හා තුමන්ත ක්‍රියා වේ.

ත්වා, ත්වාන, තූන, ය යනු පූර්ව ක්‍රියා සකස් කරගන්නා ප්‍රත්‍යය වේ.

- සුත්වා - අසා
- ගන්ත්වා - ගොස්
- දත්වා - දී
- කත්වා - කොට
- පචිත්වා - පිස

එසේ ම තුමන්ත ක්‍රියා ද අව්‍ය ක්‍රියා ගණයට වැටෙයි. එනම් සිංහලේ දී අපර ක්‍රියා යනුවෙන් හඳුන්වයි. අවසාන ක්‍රියාව සිදු වන විට සිදු වී නැති ක්‍රියා තුමන්ත ක්‍රියා වේ.

මෙහි ප්‍රත්‍යය වන්නේ තුං, තවෙ ආදිය යි.

- කත්තුං - කිරීමට

WWW.PIRIVENA.LK

- රක්ඛිතුං - රැකීමය
- හසිතුං - සිනාසීමට
- ගන්තුං - යාමට
- යාචිතුං - ඉල්ලීමට

v. තෛකාලික කිතක හඳුන්වන්න.

අතීත, වර්තමාන, අනාගත යන කාල තුනම නියෝජනය කරන කිතක මේ නමින් හැඳින්වේ. මේවා කර්තෘ කාරකයෙහි යෙදේ. බොහෝ සෙයින් ඇත්තේ ත්‍රෛකාලික කිතක ය.

- පාලක (රකින්නා)
- කත්තු (කරන්නා)
- දිනකර (හිරු)
- ධම්මධර (ධර්මය දරන)
- පාපකාරී (පව් කරන්නා)
- වදතු (කියන්නා)

WWW.PIRIVENA.LK